# පළාත් සභා නිවේදන

යොමු අංකය : ව/පස/2/1/19 (2000-3).

## වයඹ පළාත් සභාව

### වයඹ පළාතේ පළාත් සභාවේ 2000 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ - සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2000.07.04 වැනි දින සම්මත කරන ලදුව, 2000.07.06 වැනි දින වයඹ ආණ්ඩුකාරවරයා අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළු දෙනාගේ දැනගැනීම සඳහා මෙහි පළ කරමි.

එස්. හිරිමුතුගොඩ,
ලේකම්,
වයඹ පළාත් සභාව.

2000 නොවැම්බර් මස 20 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ
සභා කාර්යාලයේ දී ය.

### වයඹ පළාතේ පළාත් සභාවේ 2000 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ - සංශෝධන) ප්‍රඥප්තිය
(වයඹ ආණ්ඩුකාරවරයා අනුමැතිය දුන් දිනය : 2000.07.06)

වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හා සාමාජිකයින්ගේ වැටුප් ප්‍රතිශෝධනය කිරීම උදෙසා වයඹ පළාතේ පළාත් සභාවේ 1989 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ : -

කෙටි නාමය.

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත්, සභාවේ 2000 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

වයඹ පළාතේ පළාත් සභාවේ 1989 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

2. වයඹ පළාතේ පළාත් සභාවේ 1989 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තියෙහි 2 වැනි වගන්තිය එහි (ඉ) සහ (ඊ) ඡේද ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් ඡේද ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :

(ඉ) වයඹ පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට ගෙවනු ලබන මාසික වැටුප රුපියල් හත්දහස් පන්සියයක් ද,

(ඊ) වයඹ පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකුට ගෙවනු ලබන මාසික වැටුප රුපියල් හයදහස් දෙසිය පනහක් ද,

අනනුකූලතාවයක් වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මෙම ප්‍රඥප්තිය සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

12-834